Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# විරාම ලකුණු

## 3/4/5 ශ්‍රේණිය

!

.

?

( )

,

“ ”

-

HARSHANI

අභ්‍යාස සඳහා වාක්‍ය 150 ක්

දැනුමෙන් දිනුම කරා

හර්ෂනි නිසංසලා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**තිත** - වාක්‍ය අවසානය හැඟවීම සඳහා යොදයි .

**කොමාව** - වාක්‍යයක් අවසන් වීමට පෙර තබන විරාමය සඳහා යොදයි.

**ප්‍රශ්නාර්ථ ලකුණ** - ප්‍රශ්න අසන වාක්‍ය අග යොදයි.

**විස්මයාදී ලකුණ** - විස්මයක් /ප්‍රාර්ථනයක් / සතුටක් / ශෝකයක් හැඟවීමට යොදයි.

**යුගල උඩු කොමා** - යමකු විසින් කළ ප්‍රකාශයක්/ යමකින් උපුටා ගැනීමක් පෙන්වීම සඳහා යොදයි.

**සරල වරහන්** - ප්‍රකාශනයක අර්ථය පැහැදිලි කිරීම හෝ අමතර තොරතුරක් දැක්වීමේ දී යොදයි.

**කෙටි ඉර** - කාලපරිච්ඡේද / පිටු අංක ඉලක්කමෙන් දැක්වීමේ දී , පේළියක කෙළවරෙහි සම්පූර්ණ පදයක් සඳහා ඉඩ ප්‍රමාණය මදි වූ අවස්ථාවක දී යොදයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 3 ශ්‍රේණිය

❖පහත වාක්‍යවලට අදාළ විරාම ලකුණු යොදන්න.

1. අකුරු කියවන්නට කීවෙ බකමූණාට

2. හැමෝම එකට අත් අල්ලා ගන්න ගුරුතුමිය කිවුවා

3. ඇයි එහෙම කියන්නේ

4. මල් පෙති මගේ අත්තටු වගෙයි

5. මනුකගේ කතාවට කවුරුත් සතුටින් අත්පොළසන් දුන්නා

6. සභාවෙන් අවසරයි

7. සිටුතුමනි අපට අනුකම්පා කරනු මැනවි

8. පුතා මොක ද බර කල්පනාවක ආතා ඇසී ය

9. ගායනයට දක්ෂ අය කවි ගීත ගායනා කළා

10. අශ්ව පැටියා ඉක්මනින් ගෙදර එනවා දැකලා අම්මා පුදුම වුණා

11. මේ තමයි දුම්රිය නියාමක ආච්චි අම්මා පැවසුවා ය

12. මැස්සෙකුයි ගෙම්බෙකුයි ඉත්තෑවෙකුයි කුකුළෙකුයි ගස් කොටයක් උඩ ගෙයක් හදාගෙන උන්නා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

13. මල් පෙති මගේ අත්තටු වගෙයි

14. මම දන්නවා වැඩක් ගන්න හැටි කියලා රුංරුං පැංචා කිවුවා

15. අසා සිටි ඔබ සැමට ස්තුතියි

16. දුවේ කොළ කොඩිය වනන්නේ ගමන අරඹන්න රතු කොඩිය වනන්නේ නවත්වන්න කියලා කියන්න

17. ඉතින් මෙච්චර පරක්කු වුණේ ඇයි

18. මුහුදයි මුහුදු වෙරළයි දෙක ම ලස්සනයි

19. අලුත් සෙල්ලමක් අනේ අපටත් කියලා දෙන්නකෝ

20. සීයේ සීයේ පොල් ගෙඩියක් කඩා ගන්න ද

21. හොඳයි මගේ පුතේ පරිස්සමෙන් ගිහින් එන්න

22. අපි නම් ගමේ යනවා රුවින්දි කිවුවා

23. අන්න හරි අද සිතුම් හොඳට රඟපෑවා

24. අනේ ඇත්ත ද අපි හෙට ඒ සෙල්ලම කරමු

25. ගමනක් යද්දි අවට ඇති දැන්වීම් නාම පුවරු කියවීම ඇගේ පුරුද්දකි



HARSHANI

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

26. බරෙන් වැඩි වන්නේ ගසක මුල කොටස ද අග කොටස ද

27. ලෝකය ම ඔවුන් හඳුන්වන්නේ රයිට් සහෝදරයන් ලෙසිනුයි

28. හැමෝම අහගන්නකෝ කවිඳුගේ අම්මා උත්තර දෙන්න සූදානම් වුණා

29. යාළුවෝ හැම දෙනා ම නිදහස් උත්සවය බැලුවා

30. මට මොකද වුණේ

31. ආයුබෝවන් අද අපේ ළමා සමිතිය රැස් වෙන දවස

32. හතු මල් ගෙඩි ජාති දර එකතු කරන්න

33. හෝ ගාගෙන ඈතින් එන රැල්ලක් දැකලා කවුරුත් ටිකක් බය වුණා

34. තම්පලා කාපු හොම්බ කෝ

35. ඇයි හිනාවෙන්නේ මට රජ වෙන්න බැරි ද

36. අදාළ දිශා දැක්වීමට ඊතල ද ඇඳ තිබිණි

37. මාමේ මට මේ ගඟෙන් එගොඩ යන්න පුළුවන් වෙයි ද

38. හා එහෙනම් ඔක්කොම බිඳින්න



HARSHANI

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

39. එන්න අපි පොල් ගහ හදමු මනුක යාළුවන්ට කතා කළා

40. හඬලන රාල එයාගෙ මෝලෙ පිටි අඹරන්නට පටන් ගත්තා

41. දැක්කෙ නැද්ද කෙවිලිය

42. ඒ හින්දා ද අම්මේ තාත්තා අද ජාතික කොඩියක් එල්ලුවේ ඒ ප්‍රශ්නය ඇහුවේ කවිඳු

43. ඔව් කවුරුත් එක හඬින් පිළිතුරු දුන්නා

44. සමහරු එහා මෙහා දිවුවා සෙල්ලම් කළා

45. ගුරුතුමිය කැමරාවෙන් පින්තූරයක් ගත්තා

46. සීයා කෙනෙක් ඇයි දත් හැලුණා ද

47.ගැරුප්පුවක් හැන්දක් සහ පිඟානක් යෙදූ සංකේතයක් ආපණශාලාව ඉදිරියේ තිබිණි

48. හොඳයි මගේ පුතේ පරිස්සමෙන් ගිහින් එන්න

49. කුමරු ලණුව කිහිරි දණ්ඩේ මැදින් ගැටගැසී ය

50. රයිට් සහෝදරයන්ගේ සතුට නිම් හිම් නැති විය



HARSHANI

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# 4 ශ්‍රේණිය

❖පහත වාක්‍යවලට අදාළ විරාම ලකුණු යොදන්න.

1. ආයුබෝවන් ගුරුතුමී

2. නිපුණ කා කීවේ ය

3. ඇගේ අම්මා තාත්තා අත්තම්මා ලොකු අම්මා වගේ පවුලේ ම අය ඒ සිහිනවල ජීවත් වූහ

4. ඔහු විසින් නිර්මාණය කරන ලද අමුතු කතා පළ වූයේ තනි කථාංග වශයෙනි

5. මකුළුවා තණ බිස්සේ හැංගුණා

6. කකුල් අටකින් වේගයෙන් රෙදි වියමින් සිටි විශාල මකුළුවෙක්

7. ඕක මං දැකලා තියෙන ඕනෑ ම පැන්සලක් වාගෙයි නේ කියා මුනුපුරා කිවුවා

8. මේ ගැල් කණ්ඩායමේ නායකයා වූයේ සිටුවරයා ය

9. එසේ නම් නූල් මගින් අහසේ පා කරන්නේ කුමක් ද



HARSHANI

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

10. සීයේ සීයේ අදත් කතන්දරයක් කියන්නකෝ නංගී අයැද සිටියා ය

11. හරි අපූරු කතාවක්නේ මට කියවුණේ ඉබ්බෙට ම ය

12. රබාන වාදනය කිරීම හෙවත් රබන් ගැසීම අපේ පැරණි ජන ක්‍රීඩාවකි

13. මේ ඔයාලාගේ පොත් ගුල මුල් ගුරුතුමා කීවේ ය

14. ඔයාලා කැමති එහෙම ද මුල් ගුරුතුමා විමැසුවේ ය

15. ගයනා සිතුවම් නැමැති පොතක් කියැවීම ඇරැඹූ සිසුවෙක් කිංකිණි නාදයෙන් ගීයක් ගයන්නට විය

16. මේ ගීයේ සංගීතය නිර්මාණය කළේ ආචාර්ය ඩබ්ලිව් ඩී අමරදේව සූරීන් ය

17. සමහර ළමයි වෙරළේ ඇවිදිමින් සිප්පි කටු කවඩි හක්කැට හා බට්ටන් අවුලා අවුලා ඔඩොක්කුවල පුරවා ගනිති

18. පලක් නැති දේ කතා කිරීම ඇඟට ගුණ නැහැ කියා අත්තම්මා ළමයින්ට කිවුවා ය

19. වඳින්න යන මේ නඩේට මේ තුන් සරණේ සරණයි

20. පුංචි අපි ඒ පිපෙන මල් වගේ වෙමු

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

21. රබානෙන් වාදනය කරන පද රබන් පද ලෙස  හැඳින්වේ

22. ඔබ සැමට ජය වේවා

23. ඒ ඇයි කියලා රජතුමා පඬිතුමාගෙන් ඇහුවා

24. පැත්තකට වී සීයාගේ කතාවලට සවන් දුන් තාත්තා ඇසුවේ ය

25. කොහෙද කළුවො ගියේ ස්වාමියා කළුවාගෙන් ඇහැවුවා

26. ඉස්සර කාලේ ලංකාවේ ආඬි ගුරුන් කියලා කට්ටියක් හිටියා

27. අලුත් තේරවිලි නිර්මාණය ද අපූරු අත්දැකීමක් වනු ඇත

28. නායක සිටුතුමනි මේ අඹ වර්ගය අනුභව කළාට වරදක් නැද්ද

29. ලියන කොට ලියන කොට පැන්සලේ තුඩ මොට වෙනවා

30. බටකොළ ආච්චි බූ බබා ආදි චරිත අපට හඳුන්වා දුන් එස් ඒ දිසානායක මහතාගේ චිත්‍ර කතා නිර්මාණ කිහිපයකි

31. පවනි ර අකුර කිවුවා

32. උඩ ම පේළියේ ගැහැනු පිරිමි මල් පලතුරු සත්තු ගම් කියා ලියන්න

33. සිසිර ඉසුඹුවට පසු සිසුහු පාසල වෙත පැමිණියහ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

34. මුල් වරට සිරිපා කරුණා කරන ළාබාල අය හැඳින්වෙන්නේ කිරිකෝඩු යනුවෙනි

35. වැඳලා බහින මේ නඩේට මේ තුන් සරණේ සරණයි යනුවෙන් ප්‍රතිචාර දැක්වූහ

36. අද අපි පන්ති පුස්තකාලයක් කරමු ළමයි එක හඬින් කීහ

37. රබන් පද වාදනය මෙන් ගායනය ද විනෝදජනක ය

38. ඉතිං කොහොම ද තොරතුරු

39. එතකොට සීයේ ඉඟුරු දීලා මිරිස් ගත්තා වාගෙයි කියන්නේ ඇයි මම සීයාගෙන් ඇසීමි

40. එය විශාල ගස්වලින් සුවඳවත් මල්වලින් පිරී ගිය වනාන්තරයකි

41. පැන්සලේ වටිනා ම කොටස මොකක් ද

42. ආච්චිලා කිරි අම්මලා මුනුපුරු මිනිපිරියන්ට හරි ම ආදරෙයි

43. ඇය පුලුන් පොදියත් රැගෙන රෙදි වියන කාමරයට ගියා

44. ලියුමක් ලියන හැටි ගුරුතුමී කියලා දුන්න එක කොච්චර හොඳයි ද



HARSHANI

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

45. අපේ අම්මායි තාත්තායි මල්ලියි කෝවිලට යන්න ආසයි

46. එතකොට ප්‍රස්තාව පිරුළුවලින් කොහොම ද කතාවක් කියන්නේ මල්ලී ඇසී ය

47. මෙහි පිළිතුර කුමක් විය හැකි ද

48. මේ මොර සූරන වැස්සෙ කොහේ යන්න ද කියලා තාත්තා මාමාගෙන් ඇහුවා

49. ඉදී වැටුණු නරක් වුණු ගෙඩි ගස යට ද පිරී ඇත

50. කිරි අම්මා ලිවුවේ ලස්සන පැන්සලකින්

## 5 ශ්‍රේණිය

**සරල වරහන් (    )**

ප්‍රකාශනයක යම් තැනක අර්ථය පැහැදිලි කිරීම සඳහා හෝ අමතර තොරතුරක් දැක්වීම සඳහා හෝ වචනයක් , වාක්‍යයක් නැතහොත් වාක්‍ය කිහිපයක් අතරට යෙදීමේ දී යොදයි.

**කෙටි ඉර -**

කාලපරිච්ඡේද , පිටු අංක ආදිය ඉලක්කමෙන් දැක්වීමේ දී භාවිත කරයි.



HARSHANI

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

01. මගේ පුතාගේ අතේ ඇඟිලි කීය ද

02. මේ ලිලී අම්මා හෙවත් වයලට් ආච්චි පාසලට පැමිණියේ අමුතු ම රාජකාරියකට ය

03. ඇයගේ කැපවීම පුදුමාකාර ය

04. සමන් වැලේ මල් ජයට පිපිලා

මුළු මිදුල ම සුවඳ යි අපේ මේ

මුළු මිදුල මැ සුවඳ යි

05. ඔල්සන් කොහේ ද කියා ඇහුවේ මම යි

06. ජිම් මේ වාතයේ මොකක් හරි වරදක් තියෙනවා

07. මැ මුං තල අමු මෙතේරි

08. සතුන් වගේ ම ගංගා කඳු මුදුන් මල් තණපත් සුළං අපේ ම සහෝදර සහෝදරියෝ නොවන්නෝ ද

09. අයියේ මට කට්ට යැයි කියමින් ඈ දිවුල් කට්ට සූරා ගෙන කෑවේ ය

10. පාරේ දූවිලි ඇවිස්සී ඇත



HARSHANI

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

11. අහෝ කොතරම් ගුණවත් කොතරම් උතුම් වෙදෙක් ද

12. නගුල මම මීට කලින් දැකලා නැහැ රිසානා කීවා ය

13. සියල්ලෝ ම සිනාසුණ හ

14. අර තනි කකුලේ මේසයක් කවීෂා කීවා ය

15. කවීෂා ශබ්ද නඟා කියවීම ආරම්භ කළා ය

16. මොක ද වුණේ මොක ද වුණේ කෝ දොස්තර තීක්ෂණ රජතුමා ඇසුවේ ය

17. සෑම සැඳෑවක ම ලුයි රාත්‍රී කෑම මේසය සකසන්නට මවට උදවු වූයේ ය

18. හුරේ යැයි කහ වර්ණ හිසකෙස් ඇති මිනිසා ප්‍රබෝධයෙන් කෑගැසුවේ ය

19. සීයා පබළු ඇට දෙක තුනක් බිම දැම්මා

20. හිසේ ඇම්මක් උණක් හෙම්බිරිස්සාවක් හැදුණත් කොත්තමල්ලි ටිකක් බීලා වැඩට එනවා

21.මොක ද වුණේ කියා අපි හැමෝම එකවර ඇසුවා

22. ලංකාව ඔහු කීවේ ය



HARSHANI

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

23. සේවිකාවනි මේ බිම ඇති තෙල් පුලුන්වල පොඟවා ආරක්ෂාකාරීව තබන්න

24. දඹදිව රජගහ නුවර ජීවක නම් කුමාරයෙක් විසී ය

25. ලෝකය ගෝලාකාර බව මුලින් ම සිතුවේ කවු ද

26. ඒත් රජතුමනි එතකොට කබ්බුටයි ඔහුගේ කණ්ඩායමටයි මොක ද වෙන්නේ

27. රාජධානිය පුරා ම විද්‍යුත් තැපැල් සේවය ඊ මේල් ක්‍රියාත්මක වෙනවා

28. ඔවුන් ඊළඟට පියමැන්නේ හෙළයේ මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ සූරීන් උපන් නිවහනට ය

29. කෑගල්ල පරගම්මන ඈ උපන් ගම් පියසයි

30. ආ අර පේන්නේ ගොඩබිමක්

31. ඔහු ජීවක අමතා මෙසේ කී ය

32. ඛනිජ ලවණ විටමින් පිරි රස අහරකි පලතුරු

33. මහාචාර්ය ජේ බී දිසානායක මහතා ලියා ඇති ලිපිය කියවමු

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

34. මගේ කටින් කඩා ගත් සීනිබෝල කෑල්ල ඈ කන්නේ කොතරම් ප්‍රීතියෙන් ද

35. අයියේ සීනි බෝල ගෙනාවා ද ඇය අසනු ඇත

36. පුදුමයෙන් ඔය ඇත්තම ද

37. සේවය ම සිය රාජකාරිය කර ගත් මේ අපූරු අත්තම්මා වයස අවුරුදු අසූව ඉක්මවා තිබියදීත් විශ්‍රාම නොගත්තා ය

38. එය සිංහල බසට පරිවර්තනය කළේ එස් එම් බන්දුසීල මහතා ය

39. ඔක්සිජන් ටිකක් දීලා බලමු යි කවුදෝ කීවා

40. දකුණු පළාතේ දෑවා යැයි කියන්නේ දැම්මා යන අරුතිනි

41. වුණ දේට මං මොනවා කරන්න ද

42. හත්පණ මඟුල් කෑම හීන්සැරය ආදි කතාන්දරත් ඔබ මීට පෙර කියවා ඇති බව නිසැකයි

43. අහෝ කෙතරම් නුනුවණ කමෙක් ද

44. අපේ ගණිත පොතෙත් තියෙනවා මනින උපකරණ ඇයි මතක නැද්ද කවීෂා කීවා ය

45. පැසුණු පැන කවි පන්තියෙන් උපුටා ගත් කොටසකි

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

46. ටිං ටිං සද්දේ ඒ මැද ඇද්දේ

47. උන් එය කරන්නේ කෙසේ ද

48. ගුරුතුමනි මේ ලෝකය බෙහෙත්වලින් ම මවා ඇති සේ ය

49. මෙතැන තමයි හොඳ ම තැන යැයි අපි සියලු දෙනා ම මහ හඬින් කීවෙමු

50. මේ ගීපද පෙළ රේබාව චිත්‍රපටය සඳහා ගීතයක් ලෙස නිර්මාණය විය

# ස්තූතියි !



HARSHANI